අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

ANEX 1

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. | ED/3/53/02/15/සිසුන් ඇතුළත් කිරීම | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2024.06. 10 |

උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කරන සියලුම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව සඳහා සිසුන් ඇතුළත් කිරීම (2024/2025 වර්ෂය)**

2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ (13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ) 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම හා විෂය ධාරාවේ අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කිරීම පහත උපදෙස් පරිදි සිදු කරන ලෙස කාරුණිකව දන්වමි.

**1. සිසුන් ඇතුළත් කිරීම.**

1.1. **2023 වර්ෂයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන් සිසුන් මෙම විෂය ධාරාව යටතේ 12 ශ්‍රේණියට ඇතුළත් කළ යුතු ය. අ.පොස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵලය සිසුන් ඇතුළත් කිරීමේ නිර්ණායකයක් නොවන බව දැඩි ව අවධාරණය කෙරේ.**

1.2. පාසලට ඇතුළත් කරගන්නා වයස් සීමාව ඉක්මවා නොයන්නේ නම් ඊට පෙර වර්ෂවල අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් ද ඇතුළත් කරගත හැකි අතර 11 වන ශ්‍රේණියේ දී හෝ ඊට පෙර හෝ ශ්‍රේණිවල දී පාසල හැරගිය සිසුන් මෙම විෂය ධාරාවට ඇතුළත් වීමට ඉල්ලා සිටින අවස්ථාවල එම සිසුන්ට සිදුවන යහපත පිළිබඳ සලකා බලා ඔවුන් 12 ශ්‍රේණියට අදාළ වයසට එළඹ සිටින්නේ නම් වෘත්තිය විෂය ධාරාවට ඇතුළු වීමට අවස්ථාව සලසා දීමට විදුහල්පතිවරුන්ට හැකියාව ඇත.

1.3. **මෙහි දී අදාළ පාසලේ මෙන් ම වෙනත් රජයේ, පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලකින් හෝ පෞද්ගලිකව සාමාන්‍ය පෙළට පෙනී සිටි ඕනෑ ම සිසුවෙකු ඇතුළත් කළ හැකි ය.**

1.4. අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි පාසලෙන් ශිෂ්‍ය කාර්ය දර්ශකය ලැබී නොමැති සිසුන්ගේ නම් තාවකාලික ලේඛනයකට ඇතුළත් කර බඳවා ගත හැකි ය. අදාළ ශිෂ්‍ය කාර්ය දර්ශකය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සාමාන්‍ය පරිදි සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5. සිසුන් ඇතුළත් කිරීම සඳහා භාවිත කළ හැකි අයදුම්පතක ආකෘතියක් ඇමුණුම 1හි දැක්වේ. මෙහි මෘදු පිටපත අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ (https//moe.gov.lk) විශේෂ දැන්වීම් යටතේ පළ කර ඇත.

1.6. පාසලට අනුමත පන්ති කාමර සංඛ්‍යාවට අනුගත සිසු සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීම අත්‍යවශ්‍ය වේ. සිසුන් පාසලට ඇතුළත් කර ගැනීම සඳහා ප්‍රදේශයේ පවතින සෙසු පාසල්, ප්‍රදේශයේ ශිෂ්‍ය ප්‍රජාව සහ දෙමාපිය භාරකරුවන් දැනුවත් කිරීම පාසලේ විදුහල්පතිගේ සහ අදාළ ගුරුවරුන්ගේ වගකීමකි.

1.7. මෙම විෂය ධාරාවට ඇතුළත් වන සිසුන් ද සාමාන්‍ය පාසල් සිසුන් ලෙස ම සැලකෙන අතර ශිෂ්‍ය නිල ඇඳුම් ඇතුළු පාසල් සිසුන්ට හිමිවන සියලු වරප්‍රසාද ලබා ගැනීමට සහ ක්‍රීඩා, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් ඇතුළු අනෙකුත් පාසල් ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට ඔවුන්ට හිමිකම ඇත.

1.8. මෙම සිසුන් පාසලේ 12 ශ්‍රේණියේ ඉගෙනුම අවසන් කර 13 ශ්‍රේණියේ දී වෘත්තිය පුහුණු ආයතනයකට යොමුවන බැවින් වසරක කාල සීමාවකට පමණක් අදාළ වන පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික ගාස්තු මෙම විදුහලෙන් අයකරගත හැකි ය. මෙහිදී ආර්ථික අපහසුකම් ඇති සිසුන් ග්‍රාම නිලධාරිගේ නිර්දේශයක් මත මෙම ගාස්තුවලින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය. <u>**මේ හැර කිසිදු අමතර මුදල් අය කිරීමක් නොකළ යුතු බව දැඩි ව අවධාරණය කරමි.**</u>

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, +94112784825, minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary — +94112784811, +94112785162, secretary.education@moe.gov.lk

CamScanner

1.9. විෂය ධාරාවේ ඉදිරි කටයුතු සඳහා සෑම සිසුවෙකුටම ජාතික හැඳුනුම්පතක් සහ ලංකා බැංකු ඉතිරි කිරීමේ ගිණුමක් අනිවාර්යයෙන් තිබිය යුතු බැවින්, සිසුන් ඇතුළත් කර ගැනීමෙන් අනතුරුව එම සිසුන්ට හැඳුනුම්පත් /බැංකු ගිණුම් සකස් කරවිය යුතුය.

**2. විෂය ධාරාවේ අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කිරීම**

2.1. 2024/25 වර්ෂය සඳහා වෘත්තීය විෂය ධාරව ක්‍රියාත්මක කිරීමේ සැලසුම පහත දක්වා ඇත.

| ශ්‍රේණිය | අධ්‍යයන කාලය | වාරය | ක්‍රියාකාරකම |
|---|---|---|---|
| **12** | 2024 ජුනි සිට දෙසැම්බර් | පළමු වාරය | • පොදු විෂය ධාරාව ඉගැන්වීම<br>• සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම |
| | | දෙවන වාරය (වෘත්තීය පුහුණුව ඇරඹෙන තෙක්)* | • සිසුන්ට වෘත්තීය විෂය හඳුන්වාදීම |
| **13** | 2025 ජනවාරි සිට | වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම | |

*අ.පො.ස. (සා.පෙළ) විභාගය පැවැත්වීම ක්‍රමවත් වන තුරු පාසල් අධ්‍යයන කාල සීමාව වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා ආරම්භ කරන කාල වකවානුවලට අනුගතව සංශෝධනය කිරීමට සිදුවනු ඇත.

2.2. 12 ශ්‍රේණියේ පොදු විෂය හා වෘත්තීය විෂය ක්‍රියාත්මක කිරීම සඳහා සකසන ලද ආදර්ශ කාල සටහන් ඇමුණුම **2** මඟින් දක්වා ඇත. සිසුන්ගේ අධ්‍යයන කටයුතුවල කාර්යක්ෂමතාව උපරිම වන පරිදි ලබා දී ඇති උපදෙස්වලට අනුගත පාසල්පාදක නම්‍යශීලි කාලසටහනක් පාසලට සකසාගත හැකි ය. අදාළ ගුරුවරුන්ට ඉගැන්වීම් කටයුතුවලට අමතර ව වෘත්තීය මාර්ගෝපදේශ කටයුතු හා වෘත්තීය පුහුණුවේ යෙදෙන සිසුන් නියාමනය සඳහා කාලය වෙන් කරදීම අනිවාර්ය වේ.

2.3. විෂය ධාරාව වෙනුවෙන් ලබා දී ඇති භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතය විදුහල්පතිගේ වගකීමක් වන අතර වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ට සෑම අවස්ථාවක දී ම එම සම්පත් භාවිතා කිරීමට අවස්ථාව සම්පාදනය අනිවාර්ය වේ. විෂය ධාරාව ක්‍රියාත්මක නොකර භෞතික හා මානව සම්පත් රඳවා තබා ගැනීම විගණනයට ලක්වන කරුණක් බව ද අවධාරණය කරමි.

**3.** 2024/25 වර්ෂය සඳහා 12 ශ්‍රේණියට ඇතුළත් කළ සිසුන්ගේ සාරාංශගත තොරතුරු ඇමුණුම 3 ආකෘතිය අනුව සම්පූර්ණ කර 2024.07.31 දිනට පෙර පහත ලිපිනයන්ට යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

ලිපිනය - අධ්‍යාපන අධ්‍යක්ෂ (සැමට අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.
විද්‍යුත් ලිපිනය - vs.studentenrolled.moe@gmail.com

ජේ. එම්. තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත් -

1. සියලු ම පළාත් සම්බන්ධීකාරකවරුන් (උසස්.පෙළ වෘත්තීය විෂය ධාරාව) - කරු. අ.ක.ස.
2. සියලු ම කලාප සම්බන්ධීකාරකවරුන් ( උසස්.පෙළ වෘත්තීය විෂය ධාරාව) - කරු. අ.ක.ස.

CamScanner